# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2201/2 - 2020 නොවැම්බර් මස 09 වැනි සඳුදා - 2020.11.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 94/47(V)

**(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත**
**6(2) (ආ) වගන්තිය සහ 21(2)(ආ) වගන්තිය යටතේ වූ නියමය**

(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2)(ආ) වගන්තිය සහ 21(2)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මා විසින්, මේ නියමය මගින්-

(අ) ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති "පොළොන්නරුව සොළොස්මස්ථාන රජමහා විහාර පූජා භූමිය" යනුවෙන් හඳුන්වනු ලබන භූමි ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත් කරනු ලැබේ; සහ

(ආ) නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ඉහත ප්‍රකාශයට පත් කරනු ලැබූ "පොළොන්නරුව සොළොස්මස්ථාන රජමහා විහාර පූජා භූමිය" සම්බන්ධයෙන් පරිබාහිර සැලැස්මක් සකස් කළ යුතු බවට විධානය කරනු ලැබේ.

මහින්ද රාජපක්ෂ,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2020 නොවැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

*පොළොන්නරුව සොළොස්මස්ථාන රජමහා විහාර පූජා භූමිය සංයුක්ත වන ප්‍රදේශය*

සර්වේයර් ජනරාල්ගේ 2020 සැප්තැම්බර් මස 30 දිනැති අනුරේඛන අංක PO/TMK/2020/189 දරන හා අංක අ.නි.පි. 3950 තුළ දරන පිඹුරේ කැබලි අංක A වශයෙන් නිරූපිත උතුරු මැද පළාතේ, පොළොන්නරු දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැද පත්තුව සුළු කොට්ඨාසයේ අංක 153 බැඳි වැව, අංක 155ඒ, සිරිසඟබෝ පෙදෙස, අංක 198 ලක්ෂ උයන, අංක 199 නිශ්ශංකමල්ලපුර යන ග්‍රාම නිලධාරී වසම්වල, පොළොන්නරුව ගමෙහි පිහිටි හෙක්ටයාර් 388 (අ.958, රූ. 3, පර්. 13) ක විශාලත්වයෙන් යුක්ත පහත දැක්වෙන පරිදි මායිම් වූ බිම් ප්‍රදේශය :-



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

කැබලි අංක : A

| | | |
|---|---|---|
| උතුරට | : | වැව් රක්ෂිතය අතුරු පාර කි.මී. 0.4 ක පමණ දුරක් නැගෙනහිරට, ගෙවතු ඉඩම් අසලින් කි.මී. 2 ක් පමණ දුරක් උතුරටද, අතුරු පාර දිගේ කි.මී. 0.5ක පමණ දුරක් ගිණිකොන දිශාවටද, ගෙවතු ඉඩම් අසලින් කි.මී. 0.2 ක පමණ දුරක් දකුණට ද, ප්‍රාදේශීය සභා මාර්ගය දිගේ කි.මී. 2.4 ක පමණ දුරක් දකුණට ද, ගෙවතු ඉඩම් අසලින් කි.මී, 0.6 ක පමණ දුරක් ගිණිකොන දිශාවට වෙයි ; |
| නැගෙනහිරට | : | ගෙවතු ඉඩම් අසලින් කි.මී. 0.2 ක පමණ දුරක් දකුණට ද, ප්‍රාදේශීය සභා මාර්ගය දිගේ කි.මී. 2.4 ක පමණ දුරක් දකුණට ද, ගෙවතු ඉඩම් අසලින් කි.මී. 0.6ක පමණ දුරක් නැගෙනහිර-දකුණු දිශාවටද, එකේ ඇළ දිගේ කි.මී. 1.4 ක පමණ දුරක් ගිණිකොන දිශාවටද, ගෙවතු ඉඩම් අසළින් කි.මී. 1.4 පමණ දුරක් නිරිත දශාවට ද වෙයි ; |
| දකුණට | : | ගෙවතු ඉඩම් අසළින් කි.මී. 1.4ක පමණ දුරක් දකුණු-බටහිර දිශාවට ද එකේ ඇළ දිගේ කි.මී. 0.5ක පමණ දුරක් නිරිත දිශාවට ද, වැව් රක්ෂිතය දිගේ කි.මී. 0.3 ක පමණ දුරක් බටහිර දිශාවට ද වෙයි; සහ |
| බටහිරට | : | වැව් රක්ෂිතය දිගේ කි.මී. 2.3 ක පමණ දුරක් උතුරු දිශාවට ද, ගෙවතු ඉඩම් අසළින් කි.මී. 03 ක පමණ දුරක් නැගෙනහිර දිශාවට ද, මාර්ගය දිගේ කි.මී. 0.2 ක පමණ දුරක් උතුරු දිශාවටද, ගෙවතු ඉඩම් අසලින් කි.මී. 0.2 ක පමණ දුරක් වයඹ දිශාවලට ද, අතුරු පාර දිගේ කි.මී. 0.6 ක පමණ දුරක් උතුරට ද වැව් රක්ෂිතය ද අතුරු පාර දිගේ කි.මී. 0.4 ක පමණ දුරක් උතුරට ද, වැව් රක්ෂිතය ද, අතුරු පාර දිගේ කි.මී. 0.4 ක පමණ දුරක් නැගෙනහිරට, ගෙවතු ඉඩම් අසළින් කි.මී. 2ක පමණ දුරක් උතුරට ද වෙයි. |

සහ සර්වේයර් ජනරාල්ගේ 2020 සැප්තැම්බර් මස 30 දිනැති අනුරේඛණ අංක PO/TMK/2020/19 දරන අංක අ.නි.පි. 3950 තුළ දරන පිඹුරේ කැබලි අංක B වශයෙන් නිරූපිත උතුරු මැද පළාතේ, පොළොන්නරු දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, මැද පත්තුව සුළු කොට්ඨාසයේ, අංක 167, පොත්ගුල් පෙදෙස වසමේ, තෝපා වැව ගමෙහි පිහිටි හෙක්ටයාර් 11 (අ. 27, රූ. 0, පර්.29) ක විශාලත්වයෙන් යුක්ත පහත දැක්වෙන පරිදි මායිම් වූ බිම් ප්‍රදේශය :

කැබලි අංක : B

| | | |
|---|---|---|
| උතුරට | : | වැව් රක්ෂිතය, ජල සම්පාදන මණ්ඩලය විසින් භුක්ති විඳින ඉඩම, ගෙවතු ඉඩම් අසලින් ගිණිකොන දිශාවට කි.මී. 0.3 ක පමණ දුරක් ද, මහ නගර සභා මාර්ගය දිගේ කි.මී. 0.1 ක පමණ දුරක් දකුණු දිශාවට ද වෙයි; |
| නැගෙනහිරට | : | ගෙවතු ඉඩම් අසලින් කි.මී. 0.2 ක පමණ දුරක් ගිණිකොන දිශාවටද, මහ නගර සභා මාර්ගය දිගේ කි.මී. 0.4 ක පමණ දුරක් දකුණට ද වෙයි; |
| දකුණට | : | පන්සල් වත්ත අසලින් කි.මී. 0.2 ක පමණ දුරක් බටහිර දිශාවට ද, මාර්ගය දිගේ කි.මී. 0.1 ක පමණ දුරක් වයඹ දිශාවට ද වෙයි; සහ |
| බටහිරට | : | මාර්ගය දිගේ කි.මී. 0.6ක පමණ දුරක් උතුරු දිශාවට ද, වැව් රක්ෂිතය ද වෙයි. |

11-278

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.